# 03

**තෙවන පරිච්ඡේදය**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

# සමස්ත
# මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

**ඒසීඒ - එෆ්**

**2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| අයවැය 2022 | | සටහන | තතය 2022 | නැවත ගලපන ලද 2021 | රු. |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| | ආදායම් බදු | 1 | - | - | |
| | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 1,434,681,000 | 709,243,000 | **ඒසීඒ-3** |
| | තැන්පතු | | 239,079,354 | 185,421,121 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගිණුම් | | 45,546,282 | 18,019,240 | **ඒසීඒ-5** |
| | වෙනත් ලැබීම් | | - | - | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,719,306,636** | **912,683,361** | |
| | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,719,306,636** | **912,683,361** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | - | | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) -(ඈ)** | | **1,719,306,636** | **912,683,361** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **අඩු කළා: වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 1,193,650,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,168,025,258 | 483,931,657 | |
| 242,880,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 223,246,945 | 111,842,416 | |
| 86,250,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 106,691,603 | 77,435,090 | **ඒසීඒ-2(ii)** |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 220,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 299,913 | 297,910 | |
| **1,523,000,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **1,498,263,719** | **673,507,073** | |
| | **මූලධන වියදම්** | | | | |
| 29,300,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 13,272,944 | 8,551,062 | |
| 11,400,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 2,541,672 | 17,456,540 | |
| 10,200,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 4,905,994 | 4,500,000 | **ඒසීඒ-2(ii)** |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 17,600,000 | හැකියා වර්ධනය | 14 | 15,278,269 | 21,613,741 | |
| 176,500,000 | වෙනත් මූලධන වියදම් | 15 | 137,128,128 | 30,431,303 | |
| **245,000,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **173,127,007** | **82,552,646** | |
| | තැන්පතු ගෙවීම් | | 232,470,071 | 191,277,136 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 46,125,155 | 20,563,393 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | | | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 278,595,226 | 211,840,529 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 1,949,985,953 | 967,900,249 | |
| | **2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ=(ඉ-එ)** | | (230,679,316) | (55,216,888) | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | (230,679,316) | (55,216,888) | **ඒසීඒ-7** |
| | | | | | **ඒසීඒ-3** |

## 3.2 2022.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-පී**

### 2022.12.31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | **ඒසීඒ-6** | 925,861,071 | 665,072,565 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | **ඒසීඒ-5** | 123,662,195 | 58,068,525 |
| මුදල් හා මුදල් සමාන දෑ | **ඒසීඒ-3** | - | - |
| **මුළු වත්කම්** | | **1,049,523,266** | **723,141,090** |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 106,405,928 | 47,449,805 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 925,861,071 | 665,072,565 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | **ඒසීඒ-4** | 17,256,267 | 10,618,721 |
| අග්‍රිම ශේෂය | **ඒසීඒ-3** | - | - |
| **මුළු වගකීම්** | | **1,049,523,266** | **723,141,091** |

පිටු අංක 9 සිට 55 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 56 සිට 67 දක්වා ඇතුළත් අනෙකුත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහි දී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. එබැවින් ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක්, වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස සිදු කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට අවශ්‍ය පරිදි වෙනස්කිරීම් කිරීමට වරින් වර සමාලෝචනය සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ................................ | ................................ | ................................ |
| ප්‍රධාන ගණන් දීමේ නිලධාරී | ගණන් දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී |
| දිනය : 2023.05.31 | දිනය : 2023.05.31 | දිනය : 2023.05.31 |
| ආර් පී ඒ විමලවීර<br>ලේකම්<br>කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය<br>7 වන මහළ, "මෙහෙවර පියස"<br>නාරාහේන්පිට, කොළඹ 05. | ජේ. ඒ. ඩී. එස්. නිශාමිණී<br>ප්‍රධාන ගණකාධිකාරී<br>කම්කරු අමාත්‍යාංශය,<br>6 වන මහල, "මෙහෙවර පියස"<br>නාරාහේන්පිට,<br>කොළඹ 05. | ආර් ටී බී ඒ ඒ රත්නායක<br>ප්‍රධාන මූල්‍ය නිලධාරී<br>කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය<br>6 වන මහල, "මෙහෙවර පියස"<br>නාරාහේන්පිට, කොළඹ 05 |

## 3.3 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-සී**

### 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| | තත්‍ය | |
|---|---|---|
| | 2022 රු. | නැවත ගලපන ලද 2021 රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | |
| ලාභ | | |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 67,603,030 | 27,145,688 |
| අග්‍රිම ලැබීම් | 1,434,681,000 | 709,243,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 45,546,282 | 17,971,754 |
| තැන්පතු ලැබීම් | 238,730,729 | 185,421,121 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **1,786,561,041** | **939,781,563** |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,346,754,108 | 627,442,551 |
| සහනාධාර සහ මාරුකිරීම් | 106,991,515 | 81,935,090 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 26,058,595 | 974,412 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| අත්තිකාරම් ගෙවීම් | 38,216,664 | 20,695,833 |
| තැන්පතු ගෙවීම් | 232,167,333 | 191,277,136 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **1,750,188,215** | **922,325,023** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) - (ආ)** | **36,372,826** | **17,456,540** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |

| | | |
|---|---|---|
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 36,372,826 | 17,456,540 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **36,372,826** | **17,456,540** |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ) - (ඉ)** | **(36,372,826)** | **(17,456,540)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | |
| තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ) - (එ)** | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) - (ඒ)** | - | - |
| **2022 ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **2022 දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

**1) වාර්තාකරන කාලපරිච්ඡේදය**

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2) පිළියෙල කිරීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3) ආදායම හඳුනා ගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසළකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

**4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**6) මුදල් හා මුදල් සමාන දෑ**

2022 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

**7) මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම**

2022 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2021 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

**වගුව 3.1** ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| හිස් වාර්තාවකි | | | | | |

## 3.6 වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

**වගුව 3.2** වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,523,000/- | 1,529,850/- | 1,498,264/- | 98 |
| ප්‍රාග්ධන | 245,000/- | 245,000/- | 173,127/- | 71 |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

**වගුව 3.3** වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අ. අ. | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණු | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රති පාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| 01 | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | නවක උපාධිධාරී අභ්‍යාසලාභීන්ගේ දීමනා ගෙවීම සඳහා | | 18,463.00 | 18,463.69 | 100% |

| | | | | | |
|---|---|---|---|---|---|
| 02 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් නිරවුල් කිරීම | 346.00 | 346.00 | 100% |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

**වගුව 3.4** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

**රු. ,000**

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 31,823/- | 31,823/- | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 894,037.52 | 894,037.52 | - | 100% |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |



**ඡායාරූපය 3.1** විගමනික ශ්‍රමික දූ දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } LSW/B/MOL/SR/01/2022 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 මැයි 31 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

ශීර්ෂය - 193 කම්කරු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 193 - කම්කරු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මා කම්කරු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ

පිටුව 1 | 8

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කාලීන් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූෂණ සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- වංචාවෙන් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ ලෙසින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණකාධිකාරී නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2022 චක්‍රලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව CIGAS මෘදුකාංග පද්ධතිය මගින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම කිසිදු වෙනස් කිරීමකින් තොරව භාවිත කර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කල යුතු බවට උපදෙස් දී තිබුණද ආයතනය විසින් එම වගන්තියට පටහැනිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### 1.6.2 ආදායම් නොවන ලැබීම්

2022 වර්ෂයේ සැප්තැම්බර් මස විදේශ රැකියා අංශය, විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය, මෙම අමාත්‍යාංශයට පැවරීමේදී රු.100,000 ක නොපියවූ අත්තිකාරම් ශේෂය පවරා ගැනීම ACA 3 ආකෘතියේ වෙනත් මූල්‍ය වලින් ලැබීම් ලෙස දක්වා තිබුණි.

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 දරණ චක්‍රලේඛයේ 6 ඡේදයේ (ACA-මි) ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිය යුතු වුවත් මුදල් සටහන් පමණක් භාවිතා කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබුණි.

පිටුව 3 | 8

### 1.6.4 අත්තිකාරම් ගෙවීම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අත්තිකාරම් අයකර ගැනීම් හා ගෙවීම් පිළිවෙලින් රු.45,546,282 ක් හා රු.46,125,155 ක් වූ අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වාර්තා අනුව එය පිළිවෙලින් රු.46,120,398 ක් හා රු.111,714,067 ක් ලෙස දැක්වුණි.

### 1.6.5 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 චක්‍රලේඛයේ 7.10 මාර්ගෝපදේශය ප්‍රකාරව අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශන සමඟ අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ ඇතුලත් දත්ත ලනර නොසැසඳුන අවස්ථා විය.

### 1.6.6 අග්‍රිම ශේෂය

කම්කරු අමාත්‍යාංශය මගින් විගණනයට ඉදිරිපත් කරන ලද ශේෂ පිරික්සුමෙහි වර්ෂය තුලදී භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු. 951,492,000 ඇතුලත් කර නොතිබුණු අතර අංක 249/22 අග්‍රිම ගිණුමේ ලැබීම් හා ගෙවීම් අතර රු.951,592,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.6.7 මූල්‍ය නොවන වත්කම්

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රවාහන උපකරණ හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වල ශේෂය පිළිවෙලින් රු. 416,645,328 ක් හා රු. 216,603,735 ක් වූ අතර 2022 ජනවාරි 01 දින ආරම්භක ශේෂය ලෙස ගැනීමේදී එය පිළිවෙලින් රු.624,941,134 ක් හා රු.253,022,479 ක් ලෙස ගෙන තිබුණි. මෙම වෙනසට හේතුව ගිණුම් සටහනක් මගින් හෝ අනාවරණය කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

(අ) වැය විෂයයන් 26 කට අදාලව සලසා තිබූ රු.6,240,000 ක් වූ ලයවැය ප්‍රතිපාදනයන්ගෙන් සමාලෝචිත වර්ෂය තුල කිසිදු වියදමක් දරා නොතිබීමෙන් සියයට 100 ක ඉතිරියක් නිරීක්ෂණය විය.

(ආ) වැය විෂයන් 20 කට අදාලව සලසා තිබූ රු.62,600,000 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.22,717,543 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එමම වැය විෂයයන්ගේ ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 50 සිට සියයට 94 දක්වා පරාසයක් තුල පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී වැය විෂයන් 04 ක් සඳහා වූ ඇස්තමේන්තු අගය රු.1,900,000 සිට රු.7,409,750 ක් දක්වා එනම් සියයට 152 සිට සියයට 548 ක් දක්වා ප්‍රමාණයකින් පරිපූරක හා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ප්‍රතිපාදන වැඩිකර ගෙන තිබුණි.

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) අවස්ථා 29 කදී එකතු වටිනාකම රු. 535,170 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණද භාණ්ඩාගාර බැරකම් වාර්තාවට ඇතුලත් වී නොතිබුණි.

(ආ) අවස්ථා 21 කදී එකතු වටිනාකම රු.115,331 ක් වූ බැරකම් පරිගණකව ද්විගණනය වීමේ දෝෂයක් මත භාණ්ඩාගාර සටහන්වල ඇතුලත් වී තිබුණි.

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(අ) සේවය අතහැර ගොස් වසර 5 ට වඩා වැඩි කාලයක් ඉක්මවා ගොස් තිබූ කම්කරු අමාත්‍යාංශයේ නිලධාරියෙකුගෙන් හා විදේශ රැකියා අංශයේ නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.709,239 ක මුදල 2022 දෙසැම්බර් 31 දිනය වන විටත් අයකර ගත නොහැකිව පැවතුණි.

(ආ) රාජ්‍ය අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිට 2021 පෙබරවාරි 21 දින විශ්‍රාම ගත්වා ඇති නිලධාරියකුගෙන් අයවිය යුතු රු.198,400 ක ආපදා ණය ශේෂය අයකර ගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා නොතිබුණි. එය වාරික වශයෙන් විශ්‍රාම වැටුපෙන් අයකර එවන ලෙස 2022 මැයි මස දින රහිත ලිපියකින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා තිබුණ ද මෙම ණය ශේෂය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුවී ඇති බවට තොරතුරු විගණනයට තහවුරු නොවුණි.

(ඇ) ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ දේශීය නිවාඩු ලබාගත් සංවර්ධන නිලධාරී මහතෙකුගේ රු.91,000 ක හිඟ ආපදා ණය මුදල අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදය 1.7 ඡේදය | අනුමත කරන ලද නිවාඩු පිළිබඳ ලේඛණයක් පොදු 190 පොදු ආකෘති පත්‍රය අනුව තබාගත යුතු වුවද ඵලදායිතා ලේකම් කාර්යාලයේ නිවාඩු ලේඛණ විධිමත් පරිදි පවත්වාගෙන නොතිබූ අතර විගණන අවස්ථාව වන විට 2022 වර්ෂයට අදාලව අවස්ථා 634 කදී නිවාඩු ඉල්ලුම්පත්‍ර ඇතුලත් කර නොතිබුණි. |
| (ආ) 2009 අප්‍රේල් 16 අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව නිලධාරීන්ගේ ඇඟිලි සළකුණු වාර්තා මාසිකව පරීක්ෂා කර නොතිබූ අතර එක් නිලධාරිනියකගේ 2022 ජනවාරි සිට මැයි දක්වාම ඇඟිලි සළකුණු වාර්තාවේ පැමිණීම/ පිටවීම සඳහන් වී නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 31 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසුව මාස 12 ක කාල සීමාවෙන් පසුව හෝ 25,000 km ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කල යුතු වුවත් විදේශ රැකියා අංශය සතු වාහන 21 කට අදාලව ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණු අතර ලොග් සටහන් යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. |

පිටුව 5 | 8

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 දැක්ම හා මෙහෙවර

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ලෙස දක්වා තිබූ කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම් පසුවිපරම් කිරීම් හා ඇගයීම යන කාර්යය හා සේවක අර්ථසාධක අරමුදල පරිපාලනය කිරීම යන කාර්යය විධිමත් පරිදි ඉටුවී නොමැති බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

(අ) 2022 දෙසැම්බර් 31 දින වන විට සේවක අර්ථසාධක අරමුදලෙහි ගෙවීම් ගිණුම්වලට බැර නොවූ රු.282,726,669 ක් ද කම්කරු කොමසාරිස් දායක ගිණුමේ රු.57,174 ක් ද කම්කරු දෙපාර්තමේන්තුවේ උපකාර්යාලවල තැන්පත් ගිණුම්වල රඳවා තිබුණි.

(ආ) 2022 වර්ෂය වන විටද පෞද්ගලික අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු වී නොතිබුණි.

(ඇ) රැකියා නියුක්තිය සඳහා නියාමනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් 2022 වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක නොවුණි.

### 3.2 වත්කම් කළමණාකරණය

(අ) අමාත්‍යාංශය සතු රු.18,000,000 ක් වටිනා ටොයෝටා ලෑන්ඩ් කෲෂර් ජීප් රථය 2018 සැප්තැම්බර් මස සිට මෙම වාර්තාවේ දිනය දක්වා භාවිතයට ගෙන නොතිබූ අතර, විදේශ රැකියා අංශයේ XF-3874 දරන රථය විගණන අවස්ථාව වන විටත් උපයෝජනය කර නොතිබුණි.

(ආ) 2017 ජූනි 28 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අංක 01/2017 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂයේ සිට එක් එක් ආයතන මගින් මිලදී ගන්නා හා අපහරණය කරනු ලබන සියලුම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු අදාළ කාර්තුව අවසානයේදී කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.3 පාඩු හා හානි

2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව විදේශ රැකියා අමාත්‍යාංශය සතු ඇතිලි සලකුණු යන්ත්‍ර 2 ක් පැවති අතර 2022 වර්ෂයේ සමීක්ෂණ වාර්තා අනුව එක් යන්ත්‍රයක ඌණතාවයක් පැවතුණි. අස්ථානගත වී ඇති මෙම යන්ත්‍රය පිළිබඳව මුදල් රෙගුලාසි 103 සිට 109 ප්‍රකාරව කටයුතු කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳව අනාවරණය කර නොතිබුණි.

### 3.4 අනාර්ථික ගණුදෙනු

2020 වර්ෂයේ ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියේ ජයග්‍රාහකයන්ට පිරිනැමීම සඳහා සම්මාන කුසලාන 685 ක් සඳහා රු.4,512,123 ක ගෙවීමක් සිදුකර තිබූ අතර 2022 ජූනි 15 දින සම්මාන ගබඩාව වෙත භාර දී තිබුණි. සම්මාන භාරගෙන මසකට පසුව මේවා නිවැරදි

පිටුව 6 | 8

පිරිවිතරයන්ගෙන් පවතින්නේද යන්න වාර්තාවක් කැඳවා තිබූ අතර, 2022 සැප්තැම්බර් 21 දින NPS/PR/06/001 ලිපිය පරිදි ගබඩාවට ලබාදුන් සම්මාන ඒකක 33 ක් හැර ඉතිරි ඒවා දෝෂ සහිත බව වාර්තා කර තිබුණි. එසේ තිබියදී මෙම සම්මාන කුසලතා ජයග්‍රාහකයන්ට පිරිනැමීමට කටයුතු කර තිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) සම්පත් ඌන උපයෝජනය

2015 වර්ෂයේදී ආරම්භක මූලික වියදම රු.1,465,200 ක් දරා මාසිකව රු.25,000 බැගින් නඩත්තු වියදම් රු.1,700,000 ක්ද, අනෙකුත් වියදම් සඳහා රු.133,800 ක් වැය දරා 2022 දෙසැම්බර් 31 වන විට එකතු පිරිවැය රු.4,299,000 ක් වූ e-breeze ව්‍යාපෘතිය ඵලදායිතා සම්මාන උළෙලේ කටයුතු සඳහා භාවිතා කර ඇති නමුත්, අනෙකුත් අපේක්ෂිත කාර්යයන් වූ උත්සව කළමණාකරණය හා අධ්‍යයන කළමණාකරණය නිලධාරීන්ගේ පරිපාලන කටයුතු සඳහා යොදා ගෙන නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දින වන විට ඵලදායිතා ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති ඵලදායිතා සංවර්ධන නිලධාරීන් 639 ක් සඳහා නිසි පරිදි කාර්යභාරය පැවරුමක් හෝ ප්‍රධාන කාර්යාලයෙන් නිසි අධීක්ෂණයක් සිදු වී නොතිබුණි.

(ඇ) කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට අයත් WP CAN-1016 දරන වාහනය 2020 වර්ෂයේ සිට භාවිතා කරමින් පවතින නමුත් අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කරගැනීමට කටයුතු කර නොතිබූ අතර රථයේ ආදායම් බලපත්‍රයේ වලංගු කාලය 2021 නොවැම්බර් 19 දිනෙන් අවසන් වී තිබුණ ද එය මෙතෙක් අලුත් කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

3.6 විදේශාධාර ව්‍යාපෘති

(අ) වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සලසා නොමැති අවස්ථාවලදී විදේශාධාර උපයෝගී කරගැනීමට අවශ්‍ය වූ විට පරිපූරක ඇස්තමේන්තුවක් හෝ විසර්ජන පටිපාටිය මගින් ප්‍රතිපාදන සලසාගත යුතු වුවත් 2022 වර්ෂයේදී ආසියානු ඵලදායිතා සංවිධානය මගින් ලබාදුන් ඇමරිකානු ඩොලර් 30,712 ක ආධාර මුදල සම්බන්ධව 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මගින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 621(2) ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි.

(ආ) ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේදී බලාපොරොත්තු නොමැති විදේශාධාර සම්බන්ධයෙන් අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් මුදල්රෙගුලාසි 621(6) ප්‍රකාරව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 625(3) හා රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 30/94 ප්‍රකාරව සෘජුව ලැබෙන මුදල් ප්‍රේෂණ භාණ්ඩාගාරයේ තැන්පත් කර, එම ප්‍රදාන උපයෝගී කර ගැනීම සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන ඇති කළ යුතු වුවත් ආසියානු ඵලදායිතා සංවිධානයෙන් අවස්ථා දෙකකදී ලද එකතු වටිනාකම වූ රු.3,975,914 ක ආධාර මුදල් පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර වියදම් දරා තිබුණි.

**4. මානව සම්පත් කළමනාකරණය**

2022 වර්ෂයේදී කම්කරු අමාත්‍යාංශයේ අනුමත හා සත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 449 | 298 | 151 |
| (ii) | තෘතීයික මට්ටම | 908 | 665 | 243 |
| (iii) | ද්විතීයික මට්ටම | 5,049 | 4,800 | 249 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 858 | 704 | 154 |
| | එකතුව | 7,264 | 6,467 | 797 |

එම්.පී.අයි. ගමගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

8 | 8

# 04

## සිව්වන පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

# කාර්යසාධන දර්ශක

## 4.1 ආමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

**වගුව 4.1** අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක

| | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 1 | ශ්‍රමික අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අළුතින් පනවන ලද / සංශෝධනය කරන ලද නීති සංඛ්‍යාව * | 5 | 3 | 2 |
| 2 | අපරානුමත කරන ලද ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් සඳහා වාර්ෂික වාර්තා කිරීම් සංඛ්‍යාව | 100% | | |
| 3 | කාර්මික සාමය වර්ධනය සඳහා චළඹි ප්‍රතිපත්තිමය තීරණ සංඛ්‍යාව * | 4 | | |
| 4 | ඉලක්කගත කම්කරු පරීක්ෂණ සංඛ්‍යාවෙන් සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාවේ ප්‍රතිශතය | | | 61% |
| 5 | ළමා ශ්‍රමය පිළිබඳ ලද පැමිණිලිවලින් පරීක්ෂණ සිදු කර අවසන් සංඛ්‍යාවේ ප්‍රතිශතය | | | 54.5% |
| 6 | සමාජ කතිකාව උදෙසා පවත්වන ලද වැඩසහන් සංඛ්‍යාව ඉලක්කයෙහි ප්‍රතිශතයක් ලෙස | 100% | | |
| 7 | සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ දින 14ක් තුළ ගෙවීම් ප්‍රතිශතය | | | 67% |
| 8 | සේවකයින්ගේ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව වෙනුවෙන් බිහි කළ සුරක්ෂිතතා නිලධරයන් සංඛ්‍යාව | 100% | | |
| 9 | කම්කරු නීති පිළිබඳ ශ්‍රම බලකාය දැනුවත් කිරීම වෙනුවෙන් පවත්වන ලද පාඨමාලාවන් සංඛ්‍යාව | 115% | | |
| 10 | වෘත්තීය අනතුරු (මාරක හා මාරක නොවන) සම්බන්ධයෙන් අවසන් කළ යුතු නඩු සංඛ්‍යාවෙන් අවසන් කරන ලද සංඛ්‍යාව | 128% | | |
| 11 | ඵලදායිතා සංකල්ප පිළිබඳ අධ්‍යාපනය හා පුහුණුව ලබා දුන් සංඛ්‍යාව | 138% | | |
| 12 | පාසල් සිසුන් සඳහා සිදු කරන වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ගණන | 131% | | |

**සටහන** * - අවශ්‍යතා ඇති වන පරිදි එම ක්‍රියාකාරකම් සිදු කරන බැවින් අවසන් නිමැවුම නිශ්චිත නැත. එබැවින් ප්‍රතිශත වශයෙන් ඉදිරිපත් කළ නොහැක

| | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස තත්‍ය නිමවුම | | | |
|---|---|---|---|---|---|
| | | 100%- 90 % | 75 % - 89% | 50% - 74% | 50% අඩු |
| 13 | ශ්‍රමික සංක්‍රමණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය විෂයපථය පුළුල් කිරීම සහ යාවත්කාලීන කිරීමේ ප්‍රගතිය | | | | 40% |
| 14 | නැවත සමාලෝචනය හා යාවත්කාලීන කරන ලද ගමනාන්ත රටවල් සමඟ අත්සන් කර ඇති ගිවිසුම් සංඛ්‍යාව | | | | 45% |
| 15 | ද්විපාර්ශවීය ගිවිසුම්වලට එළඹීම සඳහා පවත්වන ලද ඒකාබද්ධ කමිටු රැස්වීම් සංඛ්‍යාව | 100% | | | |
| 16 | කලාපීය සහ ගෝලීය සහයෝගීතාව ඉහළ නැංවීම සඳහා පවත්වන ලද / සහභාගි වන ලද රැස්වීම් සහ සාකච්ඡා සංඛ්‍යාව | | 75% | | |
| 17 | සංක්‍රමණය හා සංවර්ධනය සම්බන්ධ සොයා ගැනීම් සහ නිර්දේශ ඇතුළත් අවසන් වාර්තාව සකස් වී තිබීම | 100% | | | |
| 18 | ස්විස් සංවර්ධන සහයෝගිතාව සමඟ අදියර iv යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති පසුවිරම | | | 66% | |
| 19 | විගමනික පාලන දර්ශකය පිළිබඳ තක්සේරුවක් සිදුවීම | | | 50% | |
| 20 | විගමනික ශ්‍රමික පවුල් සඳහා සකස් කර ක්‍රියාත්මක කරන ලද පවුල් සංවර්ධන සැලසුම් සංඛ්‍යාව | 90% | | | |
| 21 | විගමනික ශ්‍රමික පවුල්වල අවදානම් සහිත දරුවන් වෙනුවෙන් සකස් කරන ලද රැකවරණ සැලසුම් සංඛ්‍යාව | 100% | | | |
| 22 | පවුල් සංවර්ධන සැලසුම් සහ රැකවරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය වීම | 100% | | | |
| 23 | විගමනික ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයින් ඉලක්ක කර ගනිමින් සිදුකරන ස්වයං රැකියා/ ජීවනෝපාය ව්‍යාපෘති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | | | 66% | |
| 24 | ආපසු පැමිණි ශ්‍රමිකයන් නැවත සමාජගත කිරීම සඳහා ස්වයං රැකියා/ ජීවනෝපාය ව්‍යාපෘති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 100% | | | |
| 25 | දිස්ත්‍රික් සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරි සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව | | | 50% | |

| | | | |
|---|---|---|---|
| 26 | ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරි සම්බන්ධයෙන් පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව (අමාත්‍යාංශ නිලධාරීන් මඟින්) | | 28% |
| 27 | ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරි සම්බන්ධයෙන් පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව (දිස්ත්‍රික් සංවර්ධන නිලධාරීන් මඟින්) | 100% | |
| 28 | අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 100% | |




**ඡායාරූපය 4.1** විගමනික සුහසාධක වැඩසටහන් පැවැත්වීම

# 05

## පස්වන පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

**වගුව 5.01** අමාත්‍යාංශයට අදාළ තිරසර සංවර්ධන අරමුණු

| | ඉලක්කය / අරමුණ | | ඉලක්ක | | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| 01 | සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | 1.1 | 2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාවය තුරන් කිරීම. වර්තමාන තක්සේරු අනුව දිනකට ඩොලර් 1.25ට වඩා අඩුවෙන් ආදායම් ලබන අය අන්ත දිළිඳු කාණ්ඩයට අයත් වේ | | ස්ත්‍රී පුරුෂභාවය, වයස, සේවා නියුක්ති මට්ටම සහ භූගෝලීය පිහිටීම (නාගරික, ග්‍රාමීය) යන සාධකයන්ට අනුව අන්තර්ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහළ ජනගහණයේ අනුපාතය | • විගමනික ශ්‍රමිකයින් සඳහා ස්වයං රැකියාවලට අදාළ දැනුවත් කිරීමේ වැඩසටහන් 229ක් පවත්වා ඇත<br>• ප්‍රතිලාභීන් 181 දෙනෙකු සඳහා ස්වයං රැකියා ආධාර ලබාදී ඇත<br>• ශ්‍රමිකයින් 312,844ක් විදේශ රැකියා සඳහා ශ්‍රී.ලං.වි.සේ.නි.කා. ලියාපදිංචිය ලබා ගෙන ඇත |
| 04 | පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | 4.4 | 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම | 4.4.1 | කුසලතාවයේ ආකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයෙන් යුක්ත යොවුන් සහ වැඩිහිටි ජනගහණයේ ප්‍රමාණය | • විදේශ රැකියා අවස්ථා හඳුනා ගැනීම සඳහා සොයන්නන්ට පහසුකම් සම්පාදනය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 96ක් පවත්වා ඇත<br>• විදේශ රැකියා සඳහා පුහුණු වැඩසටහන් 2,525ක් සිදු කර ඇති අතර ඒ සඳහා 88,279 දෙනෙකු පුහුණුව ලබා ඇත |
| 08 | සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම | 8.3 | ඵලදායි ක්‍රියාකාරකම්වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලීභාවයට සහාය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තියෙන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරි ගැන්වීම | 8.3.1 | ස්ත්‍රීපුරුෂ භාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තයේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය | • පවුල් සංවර්ධන සැලසුම් හඳුනා ගන්නා ලද විගමනික පවුල් සඳහා පවුල් සංවර්ධන සැලසුම් 4,462සකස් කර ඇත<br>• විගමනික ශ්‍රමික පවුල්වල අවදානම් සහිත දරුවන් වෙනුවෙන් රැකවරණ සැලසුම් 793ක් සකස් කර ඇත<br>• විගමනික පවුල් ඉලක්ක කර ගනිමින් සංවර්ධන නිලධාරීන් විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ වෙනත් සහය සේවා වැඩසටහන් 4,438ක් පවත්වා ඇත |

| | | | | |
|---|---|---|---|---|
| | | | | • විවිධ අපහසුතාවයන්ට පත් වූ විගමනික ශ්‍රමිකයින් විදේශ දූත මණ්ඩලවල මැදිහත්වීම මත 1,641 දෙනෙකු නැවත මෙරටට ගෙන්වා ගැනීම සඳහා කටයුතු කර ඇත<br>• විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් රක්ෂණ වාරික 338,500ක් සඳහා ගෙවීම් කර ඇත |
| 8.5 | 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම | 8.5.1 | රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම ඉපැයීම | • කම්කරු නීති අනුව පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව හෝ ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් නොවේ |
| | | 8.5.2 | ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධ සහිත පුද්ගලයන්ට අදාලව විරැකියා අනුපාතය | |
| 8.7 | බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම | 8.7.1 | ස්ත්‍රීපුරුෂභාවය සහ වයස අනුව අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදාගෙන ඇති ප්‍රමාණය සහ සංඛ්‍යාව | • 2025 වර්ෂය වන විට ශ්‍රී ලංකාව ළමා ශ්‍රමයෙන් තොර දේශයක් කිරීමේ තිරසාර අරමුණ පෙරදැරිව ගම්පහ, කළුතර, බදුල්ල සහ ගාල්ල යන දිස්ත්‍රික්ක 04 'ළමා ශ්‍රමයෙන් තොර කලාප' ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා එම දිස්ත්‍රික්කයන්ට අදාළව කමිටු පත් කිරීම සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කර වැඩමුළු පැවැත්වීමට කටයුතු සිදු කරන ලදී<br>• ළමා ශ්‍රමය පිළිබඳව ලද පැමිණිලි 160ක් සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී පරීක්ෂණ සිදු කරන ලදී. ඉන් පැමිණිලි 11කදී ළමා ශ්‍රමය පිළිබඳව අනාවරණය වූ බැවින් නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලදී |

| | | | | |
|---|---|---|---|---|
| 8.8 | කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම, විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුලු සංක්‍රමණිකයින් සහ අවධානම් සහගත රැකියාවල නිරත වූවන් ඇතුලත්ව වැඩ කරන සියලුදෙනා සඳහා ආරක්ෂාකාරී සහ ප්‍රවේසම් සහගත සේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය කිරීම | 8.8.1 | ස්ත්‍රීපුරුෂභාවය සහ සංක්‍රමණික තත්ත්වය අනුව රැකියාව ආශ්‍රිත මාරක සහ මාරක නොවන අනතුරු සිදුවීමේ අනුපාතයන් | • 2022 වර්ෂය තුළදී සේවා ස්ථාන ආශ්‍රිතව ඇතිවූ මරණීය අනතුරු 66ක් හා මරණීය නොවන අනතුරු 1260ක ප්‍රමාණයක් කම්කරු දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී ඇත. මෙම අනතුරු විමර්ශනය කර අදාළ නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීමත් අනතුරට හේතු සොයා ගැනීම තුළින් එවැනි අනතුරු නැවත සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට සේවායෝජකයින් දැනුවත් කිරීමත් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. ඒ අනුව, කර්මාන්තශාලා ආඥා පනත උල්ලංඝනය වන පරිදි කටයුතු කළ සේව්‍යයන් 263කට එරෙහිව වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත |
| | | 8.8.2 | ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික මට්ටම් අනුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ලේඛන මූලාශ්‍ර ජාතික ව්‍යවස්ථාව පදනම්ව කම්කරු අයිතිවාසිකම් (රැස්වීමේ සහ සාමුහික කේවල් කිරීමේ නිදහස) සම්බන්ධයෙන් ඇති ජාතික අනුකූලතාවයේ මට්ටම | • රැස්වීමේ හා කේවල් කිරීමේ නිදහස වර්ධනය කිරීම උදෙසා වෘත්තීය සමිති ඇති කර ගැනීමට, පවත්වාගෙන යාමට හා ඒ අනුව සිය අයිතිවාසිකම් පිළිබඳ කටයුතු කිරීමට සේවකයන්හට අවස්ථාව ලබා දී ඇත. ඒ අනුව 2022 වර්ෂය තුළදී වෘත්තීය සමිති 143ක් ලියාපදිංචි කරන ලදී. එම සමිතිද ඇතුළත්ව 2022.12.31 දිනට මෙරට වලංගු වෘත්තීය සමිති සංඛ්‍යාව 2,053 කි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10 | රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම | 10.7 | හොඳින් කළමනාකරණය කරන ලද සහ සැලසුම් කරන ලද ආකාරයට සංක්‍රමණ කටයුතු ක්‍රියාවට නැංවීමද ඇතුළත්ව වගවීමෙන් යුක්තව, මනාව සංවිධානගතව, ආරක්ෂාකාරීව ජනතාවට ඔබ මොබ යාමේ සහ සංක්‍රමණය වීමේ පහසුකම් සැලසීම | 10.7.1 | සේවයේ නියුතු රට තුළ දී උපයන ආදායමේ පංගුවක් ලෙස සේවා යෝජකයා විසින් දරනු ලබන බඳවා ගැනීමේ පිරිවැය හොඳින් කළමනාකරණය වන සංක්‍රමණික ප්‍රතිපත්ති ක්‍රියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව | • ශ්‍රමික සංක්‍රමණය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය - 2008 විෂයපථය පුළුල් කිරීම හා යාවත්කාලීන කිරීමේ කටයුතු අනුව වැඩිදුරටත් සංශෝධනය කරන ලද ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත<br>• ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි සංශෝධිත පනත් කෙටුම්පත සමාලෝචනය කරමින් පවත<br>• සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා නීතිමය රාමුව සකස් කිරීම සඳහා කෙටුම්පත් සකසමින් පවත<br>• කොළඹ ක්‍රියාදාමයේ තායිලන්තයේ පැවති කලාපීය රැස්වීමට සහභාගී වීම, අබුඩාබි සංවාදයේ ජ්‍යෙෂ්ඨ නියෝජිත රැස්වීම සඳහා Zoom තාක්ෂණය ඔස්සේ සහභාගී වීම සහ GCMහි තාක්ෂණික කමිටු 02ක් පැවැත්වීම<br>• සංක්‍රමණය හා සංවර්ධනය සම්බන්ධ තක්සේරුවක් සිදු කිරීම සහ සංක්‍රමණය හා සංවර්ධනය පිළිබඳ අදාළ අවසන් වාර්තාව සකස් කර ඇත<br>• ගෝලීය ආරක්ෂිත හා නිත්‍ය වූ ශ්‍රම සංක්‍රමණය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සඳහා දෙවන කෙටුම්පත් සැලැස්ම පාර්ශවකරුවන් සමඟ හුවමාරු කර ගෙන ඇත |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාව විසින් සාක්ෂාත් කර ගත යුතු තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් අතරින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මෙහෙවර අනුව අමාත්‍යාංශය වෙත සෘජුව අදාළ වනුයේ 08 වන අභිමතාර්ථයයි. එනම්, සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම යන අභිමතාර්ථය වේ. ඒ අනුව, අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර මෙම අභිමතාර්ථය හා සමපාත වන අතර මෙම අමාත්‍යාංශයේ හා අනුබද්ධිත ආයතනවල සියලු ක්‍රියාකාරකම්හි අවසාන නිමැවුම වනුයේ මෙම අභිමථාර්තය සාර්ථකව සාක්ෂාත් කර ගැනීම වේ. ඒ අනුව ගත් කල අමාත්‍යාංශයේ සමස්ත ප්‍රගතිය මඟින් 08 වන අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය විද්‍යමාන වේ. මේ හැරුණු කොට 01,05 සහ 10 වන අභිමතාර්ථයන් වන ස්ත්‍රී, පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම, රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම යන අභිමතාර්ථ ද අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් අනුව අදාළ වේ.

තිරසර සංවර්ධන අරමුණු/ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සෘජුව සහ වක්‍රව දායක වන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට ක්‍රියාත්මක කරනු ලබයි. ඊට අමතරව අංශයේ විෂය පථය හා සම්බන්ධ අනෙකුත් ක්‍රියාකාරී සැලසුම් තුළ ඇතුළත් ක්‍රියාකාරකම් ද ක්‍රියාවට නංවයි.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගත හැකි වන සේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී පහත අභියෝගයන්ට මුහුණ පෑමට සිදු විය.

- ප්‍රමාණවත් පරිදි මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම
- ප්‍රතිඵල සහ බලපෑම ගණනය කිරීමේ ක්‍රමවේද, මෙවලම් සහ අදාළ වන පරිදි දත්ත නොමැති වීම. මේ සඳහා ජාතික මට්ටමේ මැදිහත් වීමේ අවශ්‍යතාවය පැවතීම
- විදේශ රැකියා ක්ෂේත්‍රය හා සෘජුවම සම්බන්ධ කරමින් තිරසර සංවර්ධන ඉලක්ක දක්වා නොතිබීම හේතුවෙන් ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවීම




ඡායාරූපය 5.1 විගමනික දායකත්ව විශ්‍රාම වැඩසටහන

# 06

## සයවන පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

**වගුව 6.1** 2022.12.31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය

